**4 ශ්‍රේණිය**

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්



## අපට කළහැකි වෙනස්කම්

සැකසුම :- එම්.එම්.කේ. එස් කුමාරි

❖ පන්තිය හා අවට සමීප පරිසරයේ ස්ථාන නිරීක්ෂණය කරමු.



1. පන්තියේ පිටත හා ඇතුළත පරිසරය
2. බුදු මැදුර
3. පුස්තකාලය
4. ආපණශාලාව
5. ක්‍රීඩා පිටිය
6. මල්පාත්තිය

මෙම ස්ථාන නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව

01. පිළිවෙළට පිරරිසිදුව තිබූ ස්ථාන නිරීක්ෂණය කිරීමෙන් හිතට දැනුන දේ ලියන්න.

02. අපිළිවෙළට අපිරිසිදුව තිබූ ස්ථාන නිරීක්ෂණයෙන් හිතට දැනුන දේ ලියන්න.

**අපිළිවෙළට ඇති ස්ථාන පිළිවෙළට සකස් කිරීමට අපට කළ හැකි දේ**



- ➢ අතුගෑම, සේදීම, ඉවත් කිරීම (මකුළු දැල්/කැඩී බිඳීගිය දේ)
- ➢ ක්‍රමවත් ව සකස් කිරීම හා අලුත්වැඩියා කිරීම
- ➢ කසළ බඳුන්වලට වෙන් කිරීම
- ➢ සැම දෙනාට ම පිළිවෙළට වැඩ කිරීමට සැලැස්වීම
- ➢ අලංකාර කිරීමට අවශ්‍ය මල් පැළ/විසිතුරු පැළ/එළවළු පැළ ආදිය වගා කිරීම
- ➢ නිරන්තරයෙන් වතුර දැමීම හා වල් පැළෑටි ඉවත් කිරීම . . .



තම පෞද්ගලික පිරිසිදුකම ගැන සොයා බලනවා සේම පරිසරයේ පිරිසිදුකම හා පිළිවෙළ පිළිබඳව ද සොයා බැලීමට යොමුවන්න.

**අවට පරිසරය පිරිසිදුව තබා ගැනීමට කළ හැකි දේ**

- දිරන අපද්‍රව්‍යවලින් කොම්පොස්ට් බඳුනක් සෑදීම
- නොදිරන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රිකරණය සඳහා අදාළ ස්ථානවලට බාර දීම
- වැහි පිහිලි කාණු පිරිසිදු කිරීම
- මැසි මදුරුවන් බෝවන වතුර වළවල් විනාශ කිරීම.
- පොල් කොම්බ, පොල්කටු, යෝගට් කප් ආදී ජලය රැදෙන ස්ථාන විනාශ කිරීම.
- පරිසරය පිරිසුදුව තබා ගැනීමට මල් වැවීම
- නිවස තුළට පිරිසිදු වාතය ලැබෙන පරිදි සකස් කිරීම


**අපට වෙනස් කළ නොහැකි ස්ථාන**

- ගොඩනැගිලි පිහිටි ස්ථාන
- අපිරිසිදු වූ ජලය ඇති ළිං
- උස් ස්ථාන පිරිසිදු කිරීම
- අනතුරු සිදුවිය හැකි ස්ථාන



වෙනස්කම් සිදු කිරීම සඳහා සීමිත රාමුවක් තුළ සිර නොවී අප දන්නා දේට වඩා තවදුරටත් ඉන් එහාට සිතා බැලිය යුතුය.

**ක්‍රියාකාරකම :-** (බුද්ධි කලම්බන ක්‍රියාකාරකම)




- ප්‍රථමයෙන් ම එක සමාන දුරකින් පිහිටන සේ තිත් 9ක් ඇඳගන්න.
- පෑනක් හෝ පැන්සලක් හෝ රැගෙන අත ඔසවන්නේ නැති ව ඉරි හතරකින් පමණක් තිත් සියල්ල යා කිරීමට උත්සාහ ගන්න.
- යා කිරීමට අපහසු වුවහොත් ඉහත අංක යොදා ඇති ආකාරයට උත්සාහ කරන්න.

> යහපත් වෙනසක් ඇති කිරීමට හේතු වන ප්‍රධානතම කරුණක් වන්නේ ඒ සඳහා යෝග්‍ය සැලසුම් සකස් කිරීමයි.

**<u>ශ්‍රමදාන වැඩසටහනක් සැලසුම් කරමු.</u>**

- පන්ති කාමරය තුළත්, කාමරයෙන් පිටතත් ගුණාත්මක වෙනසක් ඇති කිරීම සඳහා පහත කරුණු පිළිබඳ සැලකිලිමත් වන්න
  - පවිත්‍රතාව
  - අනවශ්‍ය දෑ ඉවත් කිරීම
  - භාණ්ඩ හා උපකරණ නියමිත ස්ථානවල තැබීම
  - අලංකරණය වැඩිදියුණු කිරීම
  - ක්‍රමාණුකූල බව වැඩිදියුණු කිරීම

**ක්‍රියාකාරකම :-**

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් ඔබ කැමති ස්ථානයක ශ්‍රමදානයක් කිරීමට සැලසුමක් සකස් කරන්න.

> යමක් කිරිම පහසුව වුවත් එය පවත්වා ගැනීම සඳහා අප සැම දෙනාගේ දායකත්වය කැපවීම උපරිමයෙන් තිබිය යුතුය.

**සැලසුම් සකස් කර කිරීමෙන් අපට ලැබෙන දේ**

- සිසුන් අතර මිත්‍රත්වය වර්ධනය වීම
- සාමූහික බව වර්ධනය වීම
- අලංකාර, ප්‍රිය ජනක පන්ති කාමරයක් නිර්මාණය වීම
- වැඩ බෙදා ගැනීම
- පිළිවෙළකට වැඩක් කිරීමට හැකි වීම
- භාණ්ඩ අදාල ස්ථානයේ ස්ථාන ගත කිරීම





## පන්ති කාමරය තුල අපට කළ හැකි වෙනස්කම්

- පන්තියේ ඩෙස්පුටුවලට තීන්ත ආලේප කිරීම
- පන්ති කමරයේ තීන්ත අලේප කිරීම
- ඩෙස්පුටු පිළිවෙළට තැබීම
- ආදර්ශ පාඨ ප්‍රදර්ශනය කිරීම
- අලංකාර පින්තූර එල්ලීම
- මකුළු දැල් ැඩීම




## පන්ති කාමරයෙන් පිටත කළහැකි වෙනස්කම්

- ඉදිරිපස මල්වවා අලංකාර කිරීම
- වල් පැළැටි ගැලවීම
- මිදුල අතු ගා පිරිසිදු කිරීම
- කාණු සැකසීම
- ආදර්ශ පාඨ ඇතුළත් පුවරු ප්‍රදර්ශනය කිරීම




## අපට නිවසේ දී කළ හැකි වෙනස් කම්



- බිත්ති පවිත්‍ර කිරීම
- මකුළු දැල් කැඩීම
- භාණ්ඩ පිළිවෙළකට තැබීම
- මල් වැවීම
- අතුගෑම
- වල් පැළැටි ඉවත් කිරිම
- පස සෝදා නොයන ලෙස සැකසීම

## පන්තිය අලංකාර කර ගැනීම සඳහා යෝග්‍ය චිත්‍රයක් සහිත නිර්මාණයක් සකසමු

<u>චිත්‍ර සඳහා අවශ්‍ය දේ:</u>

* සුදු පැහැති ʼ4 කඩදාසි
* ʼ4 ප්‍රමාණයේ කාඩ්බෝඩ්
* පාට කිරීම සඳහා අවශ්‍ය පැස්ටල් හෝ දියර වර්ණ

<u>ගෙත්තම සඳහා අවශ්‍ය දේ:</u>


සුදු ගම්, කතුරු, කළු සනකම නූල් (කෝඩ් නූල්) මීටර් 1/2,

* තද දම්, කළු සහ තැඹිලි සෙ.මී. 1/2 රිබන් මීටර් 2 බැගින් (චිත්‍රයේ වර්ණයට අනුව වටේ කැපී පෙනෙන ආකාරයට අවශ්‍ය පරිදි වර්ණ තෝරාගන්න.)

<u>සකසන ආකාරය</u>

01. චිත්‍ර කඩදාසියේ වටේ සෙ. මි 3.5 ප්‍රමාණයක ඉඩක් වෙන් කර ගන්න
02. මෝස්තරයක් සඳහා සුදුසු චිත්‍රයක් ඇතුලත කොටසේ ඇඳ ගන්න.
03. එය සුදුසු පරිදි වර්ණ ගන්වන්න.
04. වර්ණ ගැන්වීමේ දී චිත්‍රයේ කඩදාසිය වටා සෙ.මී.3.5ක ප්‍රමාණයේ ඉඩ තබා පසුබිම අලංකාරවත් ලෙස පාට කරගන්න.
05. මීටර 2 බැගින් ගත් රිබන් වර්ණ 3 එකතු කර තුඩු කෙළවරින් ගැටයක් ගසාගන්න.
06. ඉන් පසු කොණ්ඩයක් ගොතන ආකාරයට මීටර් දෙක ම සම්පූර්ණයෙන් ම ගොතා ගෙත්තමක් සකස් කර ගන්න.
07. කලින් A4 කඩදාසියේ සෙ.මී.2.5 ඉඩ ප්‍රමාණයේ මෝස්තරය වටේ නිමාවකින් යුතු ගෙත්තම ගම් භාවිතයෙන් අලවා ගන්න.

❖ එම නිර්මාණය A4 ප්‍රමාණයේ කාඩ් බෝඩයක අලවා සිදුරු 2ක් විද බිත්තියේ ප්‍රදර්ශනය කරන්න.



## අපට සිදු කළ හැකි ධනාත්මක වෙනස්කම්

පහත සඳහන් ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කරන්න.

උදා :

- නිදාගත් ස්ථානයෙන් නැගිටින විට එම ස්ථානය පිළිවෙළට ඇඳ සකස් කිරීමේ වැදගත්කම
- අපිරිසිදුවට ඇති පන්ති කාමර පිළිවෙළට සකස් කිරීමේ අවශ්‍යතාව
- ආහාර ගැනීමෙන් පසු පිඟන් කෝප්ප සෝදා නිසි තැන තැබීමේ යහපුරුදු
- වල් පැළෑටි වැවී ඇති පාත්තියක් නැවත සකස් කිරීමට උනන්දුව
- කුණු කසළ නිසි පරිදි බැහැර නොකිරීම නිසා මැසි මදුරුවන් බෝවන තැනක් නැවත එසේ නොවන පරිදි සකස් කිරීම . . . ආදි

ඔබගේ යහපත් චර්යා ඔප් නැංවෙන ආකාරයෙන් ඉහත ක්‍රියාතාරකම් සිදු මගින් නිවෙස්වල මෙබඳු වෙනස්කම් සිදු කිරීමෙන් ලබන සතුටත්, අපට අත් වෙන වාසියත් පිළිබඳ කරුණු සොයා බලන්න.






## ක්‍රීඩාවක් කරමු.

- ❖ පන්තියේ සිටින සිසුන් සියලු දෙනා ම සමාන සංඛ්‍යාවක් සහිත ව කණ්ඩායම් කර එම සෑම සිසුවකු වෙත ම කුඩා ප්‍රමාණයේ කොඩියක් බැගින් ලබා දෙන්න.
- ❖ ඉන් පසු ව මීටර 10ක ප්‍රමාණයේ සීමාවක සිට ඉදිරියේ ඇති ස්ථානයක තම කණ්ඩායම විසින් යෝජනා කරගත් හැඩය සකස් කරන්න. (හැඩය සකස් කිරීමේ දී කොඩි අතර පරතරය සෙ.මී. 60ක් පමණ වන සේ තැබීම අනිවාර්ය වේ.)
- ❖ ඉන් පසු ගුරුවරයාගේ සංඥාවට අනුව තම පේළියේ සිටින ක්‍රීඩකයන් සියලු දෙනා ම අදාළ ස්ථානය වෙත දුවගොස් යෝජනා කරගත් හැඩය සකස් කර ආපසු තමාගේ ස්ථානය වෙත පැමිණෙන්න.
- ❖ නිර්මාණය නිමවා අදාළ ස්ථානය වෙත පැමිණි අයට ජය හිමි වේ.